**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------------**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යන්ත්‍ර උපකරණ යටතේ වූ බැකෝ යන්ත්‍රය රු.3,000,000 ක තක්සේරු වටිනාකම කුබෝටා අත් ට්‍රැක්ටර් තක්සේරු වටිනාකම ලෙස සලකා මෝටර් රථ සහ කරත්ත ගිණුමට ගිණුම්ගත කිරීමෙන් මෝටර් රථ හා කරත්ත ගිණුම රු.2,853,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කහටගහමුලහේන ඉඩමේ වටිනාකම රු.100,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | වර්ෂය තුළ මිලදීගෙන තිබූ වටිනාකම රු.41,100 ක් වූ ලී බඩු උපකරණ අයිතම 03 ක් සහ වටිනාකම රු.364,452 ක් වූ යන්ත්‍ර උපකරණ අයිතම 07 ක් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත තැන්පත් ලේඛනයේ පැවති නිරවුල් කළ බවට තහවුරු නොවූ එකතු වටිනාකම රු.3,470,707 ක් වූ කර්මාන්ත තැන්පතු 55 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | තැන්පතු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.79,205 ණයහිමි ශේෂයක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල පැවති ශේෂයන් අතර රු.93,383 ක නොසැසඳීම් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් සහ ඊට අදාළ උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.279,926 ක් වූ සේවක ණය ශේෂය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මෙම ණයහිමි ශේෂය 2013.12.31 දින සිට අවසන් ගිණුමේ වැඩියෙන් පෙන්නුම් කරන අතර, ඊට පෙර කරුණු සොයා ගැනීම සඳහා අවශ්‍යලේඛන හා ගොනු සභාව සතුව නොමැත. අවසන් ගිණුමේ මෙම ශේෂය වැඩියෙන් පෙන්නුම් කරන බැවින් උප ලේඛන මඟින් සනාථ කළ නොහැකි වූ බව | ණයහිමි ශේෂ විධිමත් පරිදි කඩිනමින් නිරවුල් කළ යුතු ය. |

### 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | සෑම අර්ධ වර්ෂයක්ම අවසානයේ දී තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කළ යුතු වුවත් සභාව විසින් එසේ සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට තැන්පතු ලැයිස්තුව අර්ධ වාර්ෂිකව සකස් කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2015 නොවැම්බර් 02 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 1/2002 දරන ලිපිය | චක්‍රලේඛයේ 3,4,6.3 සහ 6.5 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එම | එම |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| | 2010 ජූලි 30 දිනැති අංක 2010/02 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.2. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | 1998 පාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | 218 රීතිය | රීතිය ප්‍රකාරව පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | වාර්ෂික ඉඩම් සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා 2023 දී ආරම්භ කළ අතර, ඉඩම් හා ගොඩනැඟිලි අතුරින් 51 ක සමීක්ෂණ කටයුතු සිදු කර නොමැති බව | රීති, උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) මාර්ගෝපදේශය | සභාව විසින් 2023 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අවම අවශයෙන් ඉදිරි වසර 03 ක කාලයකට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.9,379,462 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,294,652 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 751 | 721 | 543 | 383 | 749 | 749 | 749 | 122 |
| කුලී | 742 | 742 | 690 | 48 | 700 | 700 | 104 | 596 |
| බලපත්‍ර ගාස්තු | 1000 | 486 | 486 | - | 1,000 | 1,000 | 643 | 357 |
| වෙනත් ආදායම් | 69 | 69 | 63 | 6 | 22 | 22 | 15 | 43 |
| එකතුව | 2,562 | 2,018 | 1,782 | 437 | 2,471 | 2,471 | 1,511 | 1,118 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් ශේෂය වූ රු.325,363 ක් අයවිය යුතුව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති වරිපනම් බදු ශේෂය තුළ පෙර වර්ෂවල සිට පැවත එන රු.12,773 ක හඳුනා නොගත් වෙනසක් පැවති අතර එය සමාලෝචිත වර්ෂය තුළ ද හඳුනා ගෙන නිරවුල් කර නොතිබුණි. | හිඟ වරිපනම් ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමටත්, හිමිකරු හඳුනාගෙන නොමැති දේපලවල හිමිකරුවන් හඳුනා ගැනීමටත් , හඳුනා නොගත් වෙනස ඉදිරියේ දී නිරවුල් කර ගැනීමටත් කටයුතු කරන බව | හිඟ වරිපනම් ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමටත්, හිමිකරු හඳුනාගෙන නොමැති දේපලවල හිමිකරුවන් හඳුනා ගැනීමටත් , හඳුනා නොගත් වෙනස ඉදිරියේ දී නිරවුල් කර ගැනීමටත් කටයුතු කළ යුතු ය. |
| (ආ) | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05කට වරක් තක්සේරු කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ වරිපනම් බදු තක්සේරුව පදනම් කරගෙනම වරිපනම් අයකර තිබුණි. | පිළිගන්නා බව | වරිපනම් තක්සේරුව කාලීනව සිදු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක වටිනාකම රු.64,217,666 ක් විය. | හිඟ ශේෂයන් සම්බන්ධව කරුණු සොයා බලා ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | සභාව වෙත අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.13,694,207 ක් හා කලින් ලැබීම් රු.27,448 ක් විය. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ විධිමත් පරිදි කඩිනමින් නිරවුල් කළ යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සභාවේ රාජකාරිවල නිරත නොවන සේවකයෙකුගෙන් සේවක ණය ශේෂය තුළ වසර 10කට පෙර සිට පවතින රු.279,926 ක වෙනසක් විධිමත් පරිදි හඳුනා ගෙන නිරවුල් කර නොතිබුණි. | හඳුනා නොගත් ශේෂ ඉදිරියේ දී හඳුනා ගැනීමටත් අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමටත් කටයුතු කරන බව | අයවිය යුතු ශේෂ විධිමත් පරිදි හඳුනාගෙන නිරවුල් කළ යුතු ය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වීදි පහන් ලේඛනය යාවත්කාලීන නොවීම නිසා සභාව සතුව පවතින වීදි පහන් කනු සියල්ල දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව | වීදි පහන් ලේඛනය සහ දත්ත පද්ධතිය යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) | රු.25 – රු.300 අතර වටිනාකම සහිත ඉඩම් 43 ක් ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර පවතින අතර , ඉඩම්වල වටිනාකම් නව වෙළඳපල වටිනාකමට තක්සේරු කර නොතිබීමෙන් වත්කම්වල සත්‍ය වටිනාකම ගිණුම් තුළින් නිරූපනය නොවේ. | ඉඩම් තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ප්‍රාදේශීය සභාව සතුව නොමැති බැවින් ප්‍රතිපාදන ලද වහාම තක්සේරු කිරීම සඳහා කටයුතු කරන බව | ඉඩම්වල වටිනාකම් නව වෙළඳපල වටිනාකම් වලට තක්සේරු කළ යුතු ය. |
| (ඇ) | සභාව සතු ඉඩම් 04 ක අයිතිය පවරා ගෙන නොතිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.4,187,431 ක් වැය දරා තිබුණි. | පැවරීම් කටයුතු කරමින් පවතින බව | මෙම වත්කම්වල අයිතිය පවරා ගත යුතු ය. |
| (ඈ) | සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 50 ක් අතුරින් 33 ක අයිතිය සභාව සතුව නොවීය. | -එම- | -එම- |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්යමණ්ඩලය තුළ පුරප්පාඩු 12 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අනුමත කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | විනය විරෝධී ක්‍රියාවක් සිදුකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ නොවැම්බර් මස වැඩ තහනම් කරන ලද සේවකයෙකු සම්බන්ධයෙන් අදාළ විමර්ශන කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්ව නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා පළාත් පාලන කොමසාරිස්තුමන් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර එහි රාජකාරි සඳහා නිලධාරියකු පත්කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ විගණන වාර්තා 02 ක් පමණක් නිකුත් කර තිබීමෙන් උචිත හා ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි. | 2024 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන කටයුතු නිසි ආකාරයට සිදු කරන බව | සභාවේ කටයුතු පිළිබඳ උචිත හා ප්‍රමාණවත් විගණනයක් සිදු කළ යුතු ය. |
| (ආ) | 2023 වර්ෂයට අදාළව කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි. | -එම- | -එම- |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 28 ක සිට 93 ක් දක්වා විචලනයක් පැවතුණි. | පිළිගන්නා බව | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කිකව පිළියෙල කළ යුතුය. |
| (ආ) | වියදම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 20 කට වඩා වැඩි විචලනයක් පැවතුණි. | -එම- | වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කිකව පිළියෙල කළ යුතුය. |